www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව දෙමල රැඳවියන් "නිදහස් කිරීම" නිවේදනය කරයි

## Sri Lankan government announces "release" of Tamil detainees

සරත් කුමාර විසිනි
2009 නොවැම්බර් 27

මිලිටරි පාලනය යටතේ පවතින රැඳවුම් කඳවුරුවල සිටින ලක්ෂ සංඛ්‍යාත දෙමල සිවිල් වැසියන්ට දෙසැම්බර් 1 දා සිට "නිදහසේ ගමන් කිරීමේ අයිතිය" ලබා දෙන බව පසුගිය සෙනසුරාදා ශ්‍රී ලංකා ආන්ඩුව නිවේදනය කලේය. ජනවාරි 31 දා වන විට සියලු කඳවුරු වසා දමා සිවිල් වැසියන් ඔවුන්ගේ ගම්බිම්වල "යලි පදිංචි කරවන" බව ද එය නිවේදනය කලේය.

රැඳවුම් මධ්‍යස්ථාන පිලිබඳව ජාත්‍යන්තරව හා ශ්‍රී ලංකාව තුල වැඩෙන විවේචන හමුවේ ගනු ලැබූ මෙම තීන්දුව අතිශයින්ම කුහකය. මැයි මස මැද දී බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ මිලිටරි පරාජයෙන් පසුව, ආන්ඩුව එල්ටීටීඊ-පාලනය යටතේ පැවති ප්‍රදේශවල නිත්‍ය මිලිටරි වාඩිලෑමක් සූදානම් කර තිබේ. "නිදහස් කෙරෙන" සිවිල් වැසියෝ සිය ගමන් බිමන් හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සිරගෙයකට සමාන තහංචිවලට දිගටම යටත් කෙරෙනු ඇත.

යුද්ධයේ අවසන් අදියරවල දී සටන් පැවති ප්‍රදේශවල සිට පලා ආ 280,000ක් පමන වූ දෙමල සිවිල් වැසියන් රඳවා ගත් හමුදාව "සහන ගම්මාන" ලෙස එය නම් කල කඳවුරුවලට ඔවුන් ගාල් කලේය. උතුරේ වවුනියාව නගරය ආසන්නයේ පිහිටි මනික් ෆාම් නම් වූ විශාලතම කඳවුරේ 160,000ක් පමන මිනිසුන්, ගැහැනුන් හා ළමුන් රඳවා ගෙන සිටී.

"අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන් (අයිඩීපී)" නැතහොත් "සරනගතයන්" සලකනු ලැබ ඇත්තේ යුද සිරකරුවන් ලෙසය. මිලිටරිය විසින් පාලනය කෙරෙන මෙම කඳවුරු මැනවින් සන්නද්ධ සොල්දාදුවන් විසින් මුර කරනු ලබන අතර ඒවා කටුකම්බි වැටවලින් වට කර තිබේ. එකදු රැඳවියකුට වත් කඳවුරෙන් යාමට හා ඒමට අවසර දී නැත. කඳවුරුවල සිටින සිය මිතුරන් හා ඥාතීන් බැලීමට පැමිනෙන අමුත්තන්ට ඒ සඳහා අවසර ලැබීමට පෙර බැරෑරුම් පරීක්ෂාවකට ලක්වෙන්ට සිදුවේ.

යලි පදිංචි කිරීම් වේගවත් කර ඇති බව ද දැනට කඳවුරුවල සිටින්නේ 130,000ක් පමනක් යැයි ද ආන්ඩුව කියාපායි. ආන්ඩුව මාධ්‍යවලට එම ප්‍රදේශ තහනම් කොට එම මධ්‍යස්ථානවලට ප්‍රවිෂ්ට වීමට අවසර ලබා ඇති අතලොස්සක් පමන වන ජාත්‍යන්තර ආධාර ඒජන්සිවලට සීමාවන් පනවා ඇති බැවින් මෙම සංඛ්‍යා ලේඛනවල සත්‍ය අසත්‍ය භාවය තහවුරු කර ගත නොහැකිය. තරුනතරුනියන් 10,000කට අධික සංඛ්‍යාවක් ප්‍රශ්න කිරීමට ලක් කොට කිසිඳු බාහිර පාර්ශ්වයකට ප්‍රවිෂ්ට වීමට අවසර නැති වෙනම "රැඳවුම් මධ්‍යස්ථාන තුල" එල්ටීටීඊ සැකකරුවන් ලෙස කිසිඳු චෝදනාවකින් තොරව රඳවා ගෙන සිටී.

උතුරු පුනරුත්ථාපන කාර්ය සාධක බලකායේ සභාපති, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොහොයුරු, බැසිල්, කඳවුරු විවෘත කිරීමේ තීන්දුව මහත් උත්සවශ්‍රීයෙන් නිවේදනය කලේය. "ඔවුන්ට කඳවුරුවලින් පිටවීමේ හා ඇතුලුවීමේ නිදහස තියෙනවා, කැමති නම් ගෙවල්වලට වුනත් යන්න පුලුවන්" යයි ඔහු පැවසීය. කෙසේවෙතත්, යලි පදිංචි කිරීම කෙරෙනු ලැබෙන්නේ, මිලිටරිය විසින් ආරක්ෂිත යයි සැලකෙන ඊනියා "මුදාගත් ප්‍රදේශ" තුල පමනි.

රැඳවියන් තව දුරටත් තර්ජනයක් නොවේ යන්න පිලිබඳව මිලිටරි එකග වූ බව ද බැසිල් රාජපක්ෂ පැවසීය. එම ප්‍රකාශය වනාහි එවන් තීන්දු සම්බන්ධයෙන් තථ්‍යසමාන නිෂේධ බලයක් ජෙනරාල්වරු භුක්ති විඳින බවට දර්ශකයකි. මීට පෙර ආන්ඩුව අවධාරනය කලේ කුඩා ළමුන් හා මහලු අය ඇතුලු රැඳවියන් අතර "එල්ටීටීඊ ත්‍රස්තවාදීන්" සැගව සිටින බැවින් ඔවුන්ට කඳවුරුවලින් නිදහස් වී සිය නිවෙස් කරා යාමට ඉඩ දිය නොහැකි බවයි. මිලියන කාර්තුවකට වැඩි දෙමල සිවිල් වැසියන් පිරිසක් බලාත්කාරයෙන් රඳවා තබා ගැනීම රටේ දිග්ගැසුනු යුද්ධයේ වාර්ගික ස්වභාවය අවධාරනය කරන අතර එම යුද්ධයේ දී සියලු දෙමල වැසියන් සැලකුනේ සතුරන් ලෙසය.

රැඳවියන් නිදහස් කිරීමේ ආන්ඩුවේ තීන්දුවට ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳව මොනම උත්සුකතාවක් සමග කිසිඳු සම්බන්ධයක් නැත. එම නිවේදනය සිදු කෙරුනේ ජනාධිපති රාජපක්ෂ නියමිත කලට පෙර ජනවාරි 23 දා ජනාධිපතිවරනය කැඳවීමට යන්තම් දින කිහිපයකට පෙරය. එම නිවේදනය ඔහුගේ පාලක සභාගය තුල සිටින දෙමල දේශපාලනඥයන්ගේ සහයෝගය වර්ධනය කරගැනීමේ ද ඡන්දදායකයන්ගේ විශේෂයෙන් ම දෙමල වැසියන්ගේ පලල් ස්ථර අතර පවතින පුලුල්ව පැතිරුනු වෛරය හා විරුද්ධත්වය මොට කිරීමේ ද පැහැදිලි වෑයමකි.

කඳවුරු වසාදැමීම, රැඳවුම් මධ්‍යස්ථානවලට ප්‍රවිෂ්ට වීමේ අවස්ථාව නැතිකම ද වඩාත් පුලුල් ලෙස මානව හිමිකම් ද අරබයා එක්සත් ජනපදය හා යුරෝපා සංගමය කරන විවේචනවලට තිත තැබීමේ ද එල්ලය ඇතිව සිදු කෙරෙන්නකි. යුද්ධයේ අවසන් මාසවල දී මිලිටරිය සිදු කල යුද අපරාධ ගනයට වැටිය හැකි සිද්ධීන් සියයකට වඩා වැඩි සංඛ්‍යාවක් පෙලගස්වමින් එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව මෑත දී වාර්තාවක් නිකුත් කලේය. රෝහල් ඇතුලු, එල්ටීටීඊ-පාලිත ප්‍රදේශ මත හමුදාව එල්ල කල ඉවබවක් නැති බෝම්බ ප්‍රහාර මගින් අඩු ගනනේ සිවිල් වැසියන් 7,000ක් වත් ඝාතනය කෙරෙන්ට ඇතැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය තක්සේරු කරයි. රැඳවුම් කඳවුරු සඳහා එක හේතුවක් වූයේ, මිලිටරිය විසින් එකඳු සිවිල් වැසියකු වත් ඝාතනය කෙරුනේ නැති බවට ආන්ඩුව කරන පච ප්‍රකාශ කිසිවකු හෝ එලිදරව් කරනු වැලැක්වීමයි.

රාජපක්ෂගේ වාර්ගික යුද්ධයට නිහඬව සහයෝගය දුන් එක්සත් ජනපදය හා යුරෝපා සංගමය ප්‍රජාතන්ත්‍රවාදයේ හා මානව හිමිකම්වල ආරක්ෂකයන් නොවේ. සිවිල් වැසියන් හිතුවක්කාරී ලෙස රඳවා ගැනීම ඇතුලු කොලඹ ආන්ඩුව යුද්ධය ගෙන ගිය ආකාරය, ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපදයේ නායකත්වයෙන් ගෙන යන යුද්ධවල ආදර්ශය අනුගමනය කලේය. එක්සත් ජනපදය හා යුරෝපා සංගමය යුද අපරාධ හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ කාරනා ගසාකන්නේ, සිය ප්‍රතිවාදීන්ගේ, විශේෂයෙන් ම චීනයේ වියදමින්, කොලඹ තුල ස්වකීය ආර්ථික හා මූලෝපායික ආනුභාවය ශක්තිමත් කරගැනීමේ ලීවරයක් ලෙසය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය කඳවුරු පවත්වාගෙන යාම වෙනුවෙන් සැලකිය යුතු අරමුදල් ප්‍රදානය කරන අතරේ පවා, එක්සත් ජාතීන්ගේ මානුෂ්‍ය කටයුතු පිලිබඳ නියෝජ්‍ය ලේකම් ජෝන් හොල්මිස් පෙර දී කඳවුරු පිලිබඳව විවේචනශීලී වී තිබේ. ඔහු සියලු රැඳවියන් යලි පදිංචි කිරීමේ තීන්දුව ප්‍රශංසාවට ලක් කල අතර එහෙත් "යලි පදිංචි කිරීමේ ක්‍රියාදාමයේ ගුනාත්මක භාවය" පිලිබඳව නොඑකගතා ප්‍රකාශ කලේය. රැඳවියන්ට රුපියල් 25,000ක් මුදලින් ද තවත් ආධාර ද ලබා දෙන නමුත් "එය අසීරු ක්‍රියාදාමයක් බවට සැකයක් නැති" බව ද බව ඔහු සටහන් කර ගත්තේය. සිය නිවාස හා සෙසු දේපොල අහිමි වූ ජනයාට එම ආධාර මුලුමනින්ම නොසෑහෙයි.

යථාර්ථය නම්, නිදහස් කෙරෙන රැඳවියන්ට ලැබෙනු ඇත්තේ සුලු ආධාරයක් පමනක් වන අතර ඔවුන් දැඩි තහංචිවලට ලක් කෙරෙනු ඇත. යාපන අර්ධද්වීපයට ඔබ්බෙන් පිහිටි දිවයින් ප්‍රදේශවල කොන්දේසි පිලිබඳව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* එම ස්ථානවලට ගොස් ලබා ගත් වාර්තාවක් මගින් සොයා ගත් පරිදි, එම ප්‍රදේශවලට එවන ලද රැඳවියෝ මිතුරන්ගේ හා ඥාතීන්ගේ නිවාසවල තදබදව වෙසෙති නැතහොත් තාවකාලිකව අටවා ගැනුනු වාසස්ථානවල ජීවත් වෙති. කිසිවකුට වත් කිසිදු ආධාරයක් ලැබී තිබුනේ නැත. තියුනු සටන්වල දී බරපතල හානිවලට ලක්ව ඇති කිලිනොච්චිය හා මුලතිව් වැනි නගරවල තත්වය ඊටත් වඩා දරුනු වනු ඇත. යලි ඉදි කිරීම් ප්‍රධාන වසයෙන් නව හමුදා කඳවුරු හා පොලිස් ස්ථාන ගොඩනැගීමට සීමා වී තිබේ.

පසුගිය සති කිහිපය තිස්සේ යාපන අර්ධද්වීපයේ විවිධ කොටස්වලට ආපසු පැමින ඇති අය, ඔවුන්ගේ ව්‍යවස්ථාමය හා නෛතික අයිතීන් උල්ලංඝනය කෙරෙමින්, මාස හයක් වන තෙක් ඔවුන් යලි පදිංචි කල ප්‍රදේශයෙන් බැහැර ගමන් කිරීම හිතුවක්කාරී ලෙස තහනම් කර ඇත. ඔවුන්ගේ හැඳුනුම්පත් මත විශේෂ සලකුනක් යොදා ඇති අතර ඔවුන්ට එම කාල පරිච්ඡේදය පුරා නව හැඳුනුම්පත් සඳහා අයඳුම් කල නොහැකිය. යාපන අර්ධද්වීපයේ හිටපු වැසියන්ගෙන් බොහෝ දෙනෙක් එයින් පලා ගොස් එල්ටීටීඊ-පාලිත වන්නි කලාපය තුල සිය නිවාස තනාගෙන ඇති අතර එහෙත් ඔවුන්ට සිය පලමු ගම්මාන හා නගර කරා ආපසු යාමට බල කෙරෙයි.

ආධාර ද සීමා කෙරෙයි. වවුනියා දිසාපති පී.එස්.එම්. චාල්ස් *සන්ඩේ ටයිම්ස්* පත්‍රයට කියා සිටියේ," රුපියල් 25,000 ආධාරය සහ යලි පදංචි කිරීමේ හා යලි ඉදි කිරීමේ ආධාරය දෙනු ඇත්තේ සිය ආරම්භක ගම්මානවල පදිංචි වන අයට, විශේෂයෙන් ම කිලිනොච්චි හා මුලතිව් සිට පැමිනි අයට, පමනක්" බවයි. ඔවුන්ගේ ගම්මාන මුලුමනින්ම විනාශ වී ඇති බැවින් බොහෝ දෙනෙක් එම ප්‍රදේශයට යලි පැමිනීමට අකැමති බව මුලතිව් දිසාපතිනි ඉමෙල්ඩා සුකුමාර් පෙන්වා දුන්නාය.

සියලු දෙමල රැඳවියන් වහාම නිදහස් කරනු, කඳවුරු වසා දමනු , ඔවුන්ගේ ජීවිත යලි ගොඩනගාගැනීමට නිසි ආධාර ලබා දෙනු හා ශ්‍රී ලංකාවේ උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ආරක්ෂක හමුදා ඉවත් කරනු

යයි ඉල්ලා සිටිමින් සමාජවාදී සමානතා පක්ෂය උද්ඝෝෂනයක් දියත් කර ඇත. කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන් හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම ගැන උත්සුක සියල්ලන්ගෙන් ම සසප ඉල්ලා සිටින්නේ, ශ්‍රී ලංකා ආන්ඩුව හෙලා දකින ලිපි යැවීම, රැස්වීම් පැවැත්වීම සහ විරෝධතා සංවිධානය කිරීම මගින් අපගේ උද්ඝෝෂනයට සහයෝගය දෙන ලෙසයි.

ලිපි යැවිය යුත්තේ:

ගෝඨාභය රාජපක්ෂ
ආරක්ෂක, මහජන ආරක්ෂක, නීතිය හා සාමය
පිලිබඳ ලේකම්
ආරක්ෂක අමාත්‍යංශය, කොලඹ, ශ්‍රී ලංකාව.
ඊ-මේල්: gotabaya@defence.lk

ලලිත් වීරතුංග
ජනාධිපති ලේකම්
පැරනි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල,
කොලඹ, ශ්‍රී ලංකාව.

ඔබගේ ලිපිවල පිටපත් පහත ලිපිනයට අප වෙත එවන්න:

301 1/1
ප්‍රධාන පාර්, අත්තිඩිය, දෙහිවල, ශ්‍රී ලංකාව,
දුරකතන/ෆැක්ස්: 0094 11 2712104

ලෝක සමාජවාදී වෙබ් අඩවිය
ඊ-මේල්: editor@wsws.org

***

ශ්‍රී ලංකාවේ මහ බැංකු සේවක සංගමය පහත යෝජනාව සම්මත කොට නොවැම්බර් 12 දා ආරක්ෂක ලේකම් වෙත යවා ඇත.

මහත්මයානනි,

උතුරු පලාතේ පවත්වාගෙන යන රැඳවුම් කඳවුරුවලින් එම වැසියන් නිදහස් කිරීම

උක්ත කරුන සම්බන්ධව මෙහි පහත සඳහන් යෝජනාව අප සංගමයේ විධායක කමිටුව හමුවේ යෝජනා ස්ථිරත්වයෙන් සම්මත වූ බව දන්වා සිටිමු.

උතුරු පලාතේ මිලිටරි පාලනය යටතේ පවත්වාගෙන යන රැඳවුම් කඳවුරු ඉවත් කරන ලෙසත් ඒවායේ රඳවා සිටින 250,000කට අධික දෙමල සිවිල් වැසියන් නිදහස් කර ඔවුන්ගේ ගම්බිම්වලට යැමේ පූර්න නිදහස කොන්දේසි විරහිතව ලබා දෙන ලෙසත් ගෙන යන උද්ඝෝෂනයට මහ බැංකු සේවක සංගමය පූර්න සහාය පල කරයි. ඔවුන් නිදහස් කිරීමට ගෙන යන අරගලය ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරැකීමේ ද ආන්ඩුව එල්ල කරන ප්‍රහාරයන්ට එරෙහිව සිංහල, දෙමල, මුස්ලිම් වැඩ කරන ජනතාව එකමුතු කිරීමේ ද අරගලයේ කොටසක් ලෙස මහ බැංකු සේවක සංගමය සලකයි.

උතුරු පලාතේ එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශ ආන්ඩුවේ පාලනය යටතට ගැනීමට දියත් කෙරුනු හමුදා යුද මෙහෙයුම්වල දී ෂෙල් හා බෝම්බ ප්‍රහාරවලට ලක්ව පලා ඒමට සිදු වූ දෙමල ජනයා කාන්තාවන්, පිරිමින් හා ලමුන් මෙම කඳවුරුවලට දමා සිර කර සිටිති. ඔවුන් මොනම අපරාධයක් වත් කලෝ නොවෙති. ඔවුන් අපරාධකරුවන් කර ඇත්තේ දෙමල ජාතිකයන් වීම හේතු කොට ගෙනය. අප සංගමය මෙම වර්ගවාදී මර්දනය හෙලා දකී.

දෙමල සිවිල් වැසියන් කඳවුරුවල ගාල් කර ඇත්තේ රටේ ව්‍යවස්ථාව ද නීති පද්ධතිය ද මානව අයිතීන් ද උල්ලංඝනය කරමිනි. ආන්ඩුව මෙම කඳවුරු "සහන ගම්මාන" ලෙස නම් කර ඇතත් අවට ලෝකය සමග රැඳවියන්ගේ සම්බන්ධතා ද අවට ලෝකයට ඔවුන් සමග සම්බන්ධතා ද තහනම් ය. ඔවුන්ට ජීවත් වන්ට සලස්වා ඇත්තේ ආහාර, ඇඳුම් පැලඳුම්, සනීපාරක්ෂක පහසුකම් හා වෛද්‍යාධාර අවම මට්ටමට හෙලනු ලැබූ ශෝචනීය තත්වයකය. දස දහසකට අධික තරුනතරුනියන් දැනටමත් එල්ටීටීඊ සැකකරුවන් ලෙස වෙනත් රැඳවුම් කඳවුරුවලට රැගෙන ගොස් හුදකලා සිරකරුවන් බවට පත් කර ඇත.

මහ බැංකු සේවක සංගමයේ විධායක කමිටුව මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාව හෙලා දකින අතර රැඳවුම් කඳවුරු ඉවත් කරන ලෙස ද දෙමල සිවිල් වැසියන් කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙස ද ඉල්ලා සිටී.

මෙයට,

සභාපති
එම්.ඩබ්ලිව්. පියරත්න
මහ බැංකු සේවක සංගමය.

© www.wsws.org